AL/2024/25 B/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

යුරෝපා ඉතිහාසය II (I කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி I)
History of Europe II (Part I)

25 B S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

විභාග අංකය: ....................................

**උපදෙස්:**

- ※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- ※ **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
- ※ **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- ※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) බෝල්ටික් (2) අද්‍රියාතික් (3) ආර්ක්ටික් (4) කැස්පියන් (5) ඊජියන් (.........)

**2.** (1) ලිඩියා (2) ඇතන්ස් (3) ස්පාර්ටා (4) කොරින්ත් (5) මිලේටස් (.........)

**3.** (1) ඊස්කිලස් (2) සොෆොක්ලීස් (3) යුරිපිඩීස් (4) සොක්‍රටීස් (5) ඇරිස්ටොෆනීස් (.........)

**4.** (1) මිනෝවන් (2) ඩොරික් (3) කොරින්තියන් (4) රොමනෙස්ක් (5) ගොතික් (.........)

**5.** (1) ජුපිටර් (2) සියුස් (3) මිනර්වා (4) වීනස් (5) නෙප්චූන් (.........)

**6.** (1) ඩේසියස් (2) වැලේරියන් (3) ඩයක්ලීෂියන් (4) කොන්ස්ටන්ටයින් (5) පීටර් (.........)

**7.** (1) ඔක්ස්ෆඩ් (2) කේම්බ්‍රිජ් (3) ලූව්ර (4) හයිඩ්ල්බර්ග් (5) විටෙන්බර්ග් (.........)

**8.** (1) පෙට්රාක් (2) ලොරෙන්සෝ වල්ලා (3) නිකොලෝ මකියාවෙලී (4) මයිකලාංජලෝ (5) ෆ්‍රැන්සෙස්කො ගීච්චියාඩිනි (.........)

[දෙවැනි පිටුව බලන්න.

9. (1) ජෝන් ලොක් (2) ඇඩම් ස්මිත් (3) ජෙරමි බෙන්තම්
(4) ජෝන් ස්ටුවට් මිල් (5) ඩේවිඩ් රිකාර්ඩෝ (.........)

10. (1) විට්ටෝරියෝ ඕලැන්ඩෝ (2) ඔටෝ ෆොන් බිස්මාර්ක් (3) ලොයිඩ් ජෝර්ජ්
(4) ජෝර්ජ් ක්ලෙමන්සෝ (5) වුඩ්රෝ විල්සන් (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) පෙලපොනිසියානු යුද්ධය - ඇතන්ස් සහ ස්පාර්ටා
(2) පියුනික් යුද්ධ - රෝමය සහ කාර්තේජය
(3) කුරුස යුද්ධ - ක්‍රිස්තියානීන් සහ මුස්ලිම්වරුන්
(4) සියක් අවුරුදු යුද්ධය - ප්‍රංශය සහ එංගලන්තය
(5) තිස් අවුරුදු යුද්ධය - ඔස්ට්‍රියාව සහ ප්‍රශියාව (.........)

12. (1) ඇලෙක්සැන්ඩර්ගේ අධිරාජ්‍යය - ඇලෙක්සැන්ඩ්‍රියාව
(2) නැගෙනහිර රෝම අධිරාජ්‍යය - රෝමය
(3) ඔටොමන් අධිරාජ්‍යය - කොන්ස්තන්තිනෝපලය
(4) ඔස්ට්‍රියානු අධිරාජ්‍යය - වියනා
(5) ජර්මන් අධිරාජ්‍යය - බර්ලින් (.........)

13. (1) ලෙනාර්ඩෝ ඩා වින්චි - පුනරුදය
(2) ඉග්නේෂස් ලොයොලා - ප්‍රති-රෙපරමාදුව
(3) වොල්ටෙයාර් - බුද්ධිවාදය
(4) ඇඩම් ස්මිත් - ධනවාදය
(5) ජෙරමි බෙන්තම් - ෆේබියන් සමාජවාදය (.........)

14. (1) උත්කෘෂ්ට විප්ලවය - රජු අබිබවා පාර්ලිමේන්තුව ජයග්‍රහණය කිරීම
(2) අමෙරිකන් විප්ලවය - ජනපදවාසීන්ගේ ජයග්‍රහණය සහ අධිරාජ්‍ය බලවතාගේ පරාජය
(3) ප්‍රංශ විප්ලවය - සාර්වාදී රාජාණ්ඩුව නෙරපා දැමීම
(4) 1848 විප්ලවය - බුද්ධිමතුන්ගේ විප්ලවය
(5) බොල්ෂෙවික් විප්ලවය - කොමියුනිස්ට් රාජ්‍යයක උපත (.........)

15. (1) වර්සායි ගිවිසුම - ජර්මනිය
(2) ශාන්ත ජර්මේන් ගිවිසුම - ඔස්ට්‍රියාව
(3) නියුලි ගිවිසුම - බල්ගේරියාව
(4) ට්‍රියනොන් ගිවිසුම - ග්‍රීසිය
(5) ලොසැන් ගිවිසුම - තුර්කිය (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| X | Y |
|---|---|
| (i) ටයිබර් | A - වියනා |
| (ii) සේන් | B - ලිස්බන් |
| (iii) ඩැනියුබ් | C - වෝර්සෝ |
| (iv) ටාගුස් | D - රෝමය |
| (v) විස්ටියුලා | E - පැරිස් |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E A D C B (5) E D A C B (.........)

5356

| | X | | Y |
|---|---|---|---|
| **17.** | (i) මිලාන් ආඥාව | A | - ලූතර් කතෝලික සභාවෙන් නෙරපීම |
| | (ii) නැන්ටීස් ආඥාව | B | - වතිකානු නගරය ස්වෛරී රාජ්‍යයක් ලෙසත්, කතෝලික ආගම ඉතාලියේ නිල රාජ්‍ය ආගම ලෙසත් පිළිගැනීම |
| | (iii) 1520 පාප් ආඥාව | C | - "පාලනය කරන්නේ කවරෙක් ද, ඔහුගේ ආගම ඔහුගේ රටවැසියන්ගේ ද ආගම විය යුතු ය." |
| | (iv) ඔග්ස්බර්ග් සාම ගිවිසුම | D | - ප්‍රංශයේ ප්‍රොතෙස්තාන්ත භක්තිකයන්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |
| | (v) ලැටරන් ගිවිසුම | E | - කිතුණුවන්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB(.........)

| | X | | Y |
|---|---|---|---|
| **18.** | (i) ඔමාර් ඛයියාම් | A | - වෙනිසියේ වෙළෙන්දා |
| | (ii) ඩාන්ටේ ඇලිගියරි | B | - කැන්ටබරි කථා (Canterbury Tales) |
| | (iii) ජියොවන්නි බොකැෂියෝ | C | - ඩිවයින් කොමෙඩි |
| | (iv) ජෙෆ්රි චෝසර් | D | - රුබයියාට් |
| | (v) විලියම් ෂේක්ස්පියර් | E | - ඩිකැමරන් |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB(.........)

| | X | | Y |
|---|---|---|---|
| **19.** | (i) කැල්වින්වාදීන් | A | - ප්‍රංශය |
| | (ii) හ්‍යුගනෝවරුන් | B | - ඕලන්දය |
| | (iii) පියුරිටන්වරුන් | C | - ස්කොට්ලන්තය |
| | (iv) ප්‍රෙස්බිටීරියන්වරුන් | D | - එංගලන්තය |
| | (v) රෙපරමාදු පල්ලියේ සාමාජිකයන් | E | - ස්විට්සර්ලන්තය |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB(.........)

| | X | | Y |
|---|---|---|---|
| **20.** | (i) මහා ෆෙඩ්රික් | A | - ඔස්ට්‍රියාව |
| | (ii) මහා කැතරින් | B | - ප්‍රංශය |
| | (iii) තුන්වන චාල්ස් | C | - රුසියාව |
| | (iv) දෙවන ජෝශප් | D | - ප්‍රශියාව |
| | (v) පහළොස්වන ලුවී | E | - ස්පාඤ්ඤය |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB(.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**. එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. පුරාණ ග්‍රීසිය**

(1) පුරාණ ග්‍රීසියේ පෞර රාජ්‍ය ක්‍රමයක් පැවතුණි.
(2) පූජක තන්ත්‍රය, පුරාණ ග්‍රීකයන් අතර වඩාත් ම ජනප්‍රිය වූ ආණ්ඩුක්‍රමය විය.
(3) පුරාණ ග්‍රීසියේ ආර්ථිකයේ වැඩි ප්‍රමාණයක් වහල්ක්‍රමය මත රැඳී පැවතුණි.
(4) මැරතොන් සහ සලාමිස් සංග්‍රාමවලදී ග්‍රීකයෝ තීරණාත්මක ලෙස පර්සියානුවන් පරාජය කළහ.
(5) ක්‍රි.පූ. හතරවන සියවසේ දී ග්‍රීක පෞර රාජ්‍ය මැසිඩෝනියාවේ ආධිපත්‍යය යටතට පත්විය. (.........)

**22. ම්ලේච්ඡ ආක්‍රමණ**

(1) රෝමවරු, ජර්මන් ගෝත්‍ර ම්ලේච්ඡයන් ලෙස සැලකූහ.
(2) ෆ්‍රැන්ක්වරු ගෝල් දේශයෙහි පදිංචි වූහ.
(3) ක්‍රි.ව. පස්වන සියවසේ දී විසිගොත්වරු හා වැන්ඩල්වරු රෝමය විනාශ කළහ.
(4) ම්ලේච්ඡ ආක්‍රමණ, බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීමට සැලකිය යුතු ප්‍රමාණයකින් දායක විය.
(5) ම්ලේච්ඡ ආක්‍රමණ බයිසැන්ටයින් අධිරාජ්‍යයේ පරිහානියට මග පෑදී ය. (.........)

[හතරවැනි පිටුව බලන්න.

**23. වෙස්ට්ෆේලියා සාම ගිවිසුම**

(1) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම තිස් අවුරුදු යුද්ධය අවසන් කළේ ය.
(2) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම මගින් ප්‍රංශයේ සහ එම පාක්ෂිකයන්ගේ ජයග්‍රහණය තහවුරු කෙරිණි.
(3) වෙස්ට්ෆේලියා සාම ගිවිසුමෙන් ජර්මන් රාජ්‍යවල ස්වෛරීභාවය පිළිගනු ලැබී ය.
(4) වෙස්ට්ෆේලියා සාම ගිවිසුමෙන් ශුද්ධ රෝම අධිරාජ්‍යය ශක්තිමත් කෙරිණි.
(5) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම යුරෝපයේ ආගමික යුද්ධ අවසන් කළේ ය. (.........)

**24. 1848 විප්ලව**

(1) 1848, බොහෝ විට විප්ලව වසර ලෙස හඳුන්වනු ලැබේ.
(2) විප්ලවය මුලින් ම ප්‍රංශයේ මතු විය.
(3) හංගේරියානු විප්ලවය ලුවී බ්ලාන්ක් විසින් මෙහෙයවන ලදී.
(4) ඔස්ට්‍රියාවේ චාන්සලර්වරයා වූ මෙටර්නික්ට විප්ලවය ඉදිරියේ ඉල්ලා අස්වීමට සිදු විය.
(5) විප්ලව සියල්ල ම පාහේ අසාර්ථක විය. (.........)

**25. එක්සත් ජාතීන්ගේ සංවිධානය**

(1) එක්සත් ජාතීන්ගේ සංවිධානය පළමුවන ලෝක යුද්ධයෙන් පසුව 1919 දී පිහිටුවනු ලැබී ය.
(2) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සාමය ආරක්ෂා කිරීම සහ ආර්ථික, සමාජ, අධ්‍යාපනික හා සංස්කෘතික ප්‍රගතිය දිරිගැන්වීම මගින් ගැටුම්වලට තුඩුදෙන හේතු ඉවත් කිරීමයි.
(3) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානය නිව්යෝර්ක් හි පිහිටුවා ඇත.
(4) එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලය, මහලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ.
(5) සාම සාධක ප්‍රයත්නයන්හි දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ජාතීන්ගේ සංගමයට වඩා සාර්ථක වී ඇත. (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........ **5** ද, **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** පුරාණ ග්‍රීකයන්ගේ ආගම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පුරාණ ග්‍රීකයෝ විවිධ දෙවිවරුන් හා දෙවඟනන් ගණනාවකට වන්දනාමාන කළහ.
(B) ඇතන්ස්හි පාලකයන් අර්ධ දෙවිවරුන් ලෙස සලකන ලදී.
(C) සියුස්, සමස්ත ග්‍රීක දේව සභාවේ ප්‍රධාන දෙවියා විය.
(D) ග්‍රීක ආගම ක්‍රිස්තියානියේ නැගීමට මග පෑදී ය. (.........)

**27.** වැඩවසම් ක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) රෝම අධිරාජ්‍යයේ පැවති දේශපාලන හා ආර්ථික ක්‍රමය වැඩවසම් ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලැබේ.
(B) වැඩවසම් ක්‍රමය යටතේ සිටි ප්‍රධාන ශ්‍රමික පන්තිය වහල්ලු වූහ.
(C) වැඩවසම් ක්‍රමය යටතේ රදළ ප්‍රභුවරු තමන් භුක්ති විඳි ඉඩම් වෙනුවෙන් රජුට හමුදා සැපයීමට බැඳී සිටියහ.
(D) මධ්‍යතන යුගයේ අවසානය වන විට වැඩවසම් ක්‍රමය පිරිහීමට පටන් ගත්තේ ය. (.........)

[පස්වැනි පිටුව බලන්න.

**28.** ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය, රෝමානු කතෝලික පල්ලියේ ඉගැන්වීම් හා පිළිවෙත් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇති වූ ව්‍යාපාරයකි.
(B) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ජර්මනියේ ආරම්භ විය.
(C) 1517 දී මාටින් ලූතර් පාප් සංස්ථාවේ දූෂණවලට එරෙහිව සිය විරෝධය දියත් කළේ ය.
(D) උල්රිච් ස්විංලි ආගමික ප්‍රතිසංස්කරණයේ තවත් නායකයකු විය. (………)

**29.** ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) අසමානතා පදනම් කරගත් අර්ධ වැඩවසම් සමාජ ව්‍යුහය ප්‍රංශ විප්ලවය ඇතිවීමට පසුබිම නිර්මාණය කළේ ය.
(B) මධ්‍යම පන්තිය ප්‍රංශ විප්ලවයට නායකත්වය දුන්නේ ය.
(C) අබේ සියෙස් ප්‍රංශ රාජාණ්ඩුවේ බලවත් ආධාරකරුවකු විය.
(D) දහඅටවන ලුවී විප්ලව සමයේ දී ප්‍රංශයේ රජු ලෙස ඔටුනු පළඳවනු ලැබී ය. (………)

**30.** බොල්ෂෙවික් විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) බොල්ෂෙවික් විප්ලව අවස්ථාවේ දී ස්වාධීනතා ප්‍රකාශනයක් නිකුත් කරන ලදී.
(B) වී. අයි. ලෙනින් බොල්ෂෙවික් විප්ලවය එහි සාර්ථකත්වය කරා මෙහෙයවී ය.
(C) බොල්ෂෙවික් විප්ලවයෙන් පසු නිර්ධන පාන්තික ආඥාදායකත්වයක් පිහිටුවන ලදී.
(D) ලෙනින්ගෙන් පසුව කෙරන්ස්කි සෝවියට් දේශයේ නායකයා බවට පත්විය. (………)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** ඇලෙක්සැන්ඩර්ගේ ගුරුවරයා ලෙස සේවය කළේ කිනම් ග්‍රීක දාර්ශනිකයා ද?
(1) ඩිමොක්‍රිටස් (2) සොක්‍රටීස් (3) ප්ලේටෝ
(4) ඇරිස්ටෝටල් (5) සිනෝ (………)

**32.** 'වීනස්ගේ උපත' චිත්‍රණය කළ සුප්‍රසිද්ධ ෆ්ලොරන්ටයින් කලාකරුවා කවුද?
(1) මසචියෝ (2) ඩොනටෙලෝ (3) සැන්ඩ්‍රො බොටිචෙලි
(4) ලෙනාර්ඩෝ ඩා වින්චි (5) රෆායල් (………)

**33.** එංගලන්තයේ පළමු අගමැතිවරයා ලෙස සැලකෙන්නේ කවරෙක් ද?
(1) ඔලිවර් ක්‍රොම්වෙල් (2) රොබට් වෝල්පෝල් (3) විලියම් පිට්
(4) විලියම් ග්‍රෙන්විල් (5) ජෝර්ජ් කැනිං (………)

**34.** අමෙරිකානු විප්ලවයේ නායකයා කවුද?
(1) ජෝර්ජ් වොෂිංටන් (2) ජෝන් ඇඩම්ස් (3) තෝමස් ජෙෆර්සන්
(4) සැමුවෙල් ඇඩම්ස් (5) බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් (………)

**35.** දෙවන ලෝක යුද්ධය ආරම්භ වන විට අමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා වූයේ කවරෙක් ද?
(1) වුඩ්රෝ විල්සන් (2) වොරන් හාර්ඩිං (3) කැල්වින් කූලිජ්
(4) හර්බට් හූවර් (5) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (………)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | ග්‍රීක නාට්‍ය රඟ දක්වන ලද ප්‍රධාන රැඟුම් හල වූයේ පාර්තිනොන් ය. | පළමුවන රෝම අධිරාජයා ජුලියස් සීසර් විය. | (.........) |
| **37.** | 'මානවවාදය' යන පදයෙහි අර්ථ දෙකක් ගැබ්ව ඇත : එකක් නම් මානව ශාස්ත්‍ර හැදෑරීමයි, අනෙක මිනිසාගේ අභිමානය පිළිබඳ අවධාරණයයි. | මානවවාදය පුනරුදයේ වැදගත් ලක්ෂණයකි. | (.........) |
| **38.** | ලේ නොසැලුන විප්ලවයක් වූ උත්කෘෂ්ට විප්ලව අවස්ථාවේ දී දෙවන ජේම්ස් බලයෙන් පහකොට පාර්ලිමේන්තු පනතකින් විලියම් සහ මේරි එංගලන්තයේ රජු සහ රැජිණ ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. | දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩු දුන් ආසන්නතම හේතුව වූයේ සරයේවෝ සිද්ධිය හෙවත් ඔස්ට්‍රියාවේ ආදිපාදවරයා වූ ෆ්‍රැන්සිස් ෆර්ඩිනන්ඩ් ඝාතනය කිරීමයි. | (.........) |
| **39.** | ජීන් ජැක් රූසෝගේ ලේඛන හා අදහස් ප්‍රංශ විප්ලවය හැඩගැස්වීමෙහි ලා විශාල බලපෑමක් සිදු කොට තිබේ. | ප්‍රංශ විප්ලවයේ මුල් අවස්ථාවේ දී නිකුත් කරන ලද මිනිස් හා පුරවැසි අයිතිවාසිකම් ප්‍රකාශනය, රූසෝගේ 'සමාජ සම්මුතිය' නම් ග්‍රන්ථයේ මුල් වාක්‍යය වූ "මිනිසා නිදහස්ව උපත ලබයි" යන්නෙන් ආරම්භ වේ. | (.........) |
| **40.** | නිකිතා කෘෂෙෆ්, ග්ලස්නොස්ට් (විවෘතභාවය) හා පෙරෙස්ත්‍රොයිකා (ආර්ථික සහ සමාජ ප්‍රතිසංස්කරණය) නම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළේ ය. | ජර්මනිය යළි එක්සත් කිරීමට මඟ පාදමින් 1989 දී බර්ලින් තාප්පය කඩා බිඳ හෙළනු ලැබී ය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| යුරෝපා ඉතිහාසය II<br>ஐரோப்பிய வரலாறு II<br>History of Europe II | 25 B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

**යුරෝපා ඉතිහාසය II (II කොටස)**
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

**25 B** **S** **II**

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**

* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) බෝල්ටික් මුහුද (ii) කෝසිකා (iii) ඇතන්ස්
(iv) ස්පාඤ්ඤය (v) ඩැනියුබ් ගඟ (vi) ලන්ඩන්
(vii) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය (viii) උතුරු මුහුද (ix) ඉස්තාන්බුල්
(x) ශාන්ත පීටර්ස්බර්ග් (xi) ඩැන්සිග් (xii) කීල් ඇළ

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි)

## B කොටස

**2.** (i) පුරාණ රෝමවරුන් අතර පැවති විවිධ ආණ්ඩුක්‍රමවල දක්නට ලැබුණ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

(ii) සාහිත්‍යය සහ ගෘහ නිර්මාණ ශිල්පය යන ක්ෂේත්‍රවල පුරාණ රෝමවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධනයන් පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

**3.** "දේශ ගවේෂණ වූ කලී විවිධාකාර වූ ආර්ථික, දේශපාලන සහ ආගමික හේතු සමූහයක ප්‍රතිඵලයකි."

(i) දේශ ගවේෂණවලට මුල පිරූ අයිබීරියානු රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) එම රටවල මුල්කාලීන ගවේෂණවලට අනුග්‍රහය දැක් වූ පාලකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) එම රටවල් අතුරෙන් **එකක්** නිරත වූ මුල්කාලීන ගවේෂණ සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)

(iv) පහළොස්වන සියවසේ දෙවන භාගයේ දී හා දහසයවන සියවසේ මුල් භාගයේ දී ඇති වූ දේශ ගවේෂණවලට තුඩුදුන් ප්‍රධාන ආර්ථික, දේශපාලන හා ආගමික හේතු විචාරාත්මකව විමසන්න. (ලකුණු 09 යි)

**4.** (i) 'කාර්මික විප්ලවය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) කාර්මික විප්ලව සමයේ දී බිහි වූ ප්‍රධාන නව උත්පාදන සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවය එංගලන්තයේ ඇතිවීමට තුඩුදුන් ආර්ථික හා සමාජ තත්ත්වයන් විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 යි)

[අටවැනි පිටුව බලන්න.

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම

(ii) ඉතාලි පුනරුදය ඇති වූ පසුබිම

(iii) ප්‍රති රෙපරමාදුව

(iv) තිස් අවුරුදු යුද්ධය

(ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

**6.** "ආඥාදායක පාලනයක් ගෙනගිය ද නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන කාර්ය සාධනයන් ආරක්ෂා කළේ ය, ශක්තිමත් කළේ ය, ඒ අතර ම ඒවා වෙනත් රටවලට ගෙන ගියේ ය."

(i) නැපෝලියන් බොනපාර්ට් උපන් ස්ථානය නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) නැපෝලියන් බොනපාර්ට් බලයට පත්වීමට පෙර විප්ලව සමයේ ප්‍රංශයේ පැවති **එක්** ආණ්ඩු ක්‍රමයක් නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ පාලකයා බවට පත් වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ ක්‍රියාත්මක කළ දේශීය ප්‍රතිපත්තිය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 10 යි)

**7.** (i) 1815 සිට 1848 දක්වා කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමට එරෙහිව පැවති බාධක විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) ඉතාලිය එක්සත් කිරීමෙහි ලා කැවූර් සහ ගැරිබෝල්ඩි විසින් ඉටුකරන ලද කාර්යභාරයන් පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

**8.** සුපිරි බලවතුන්ගේ නැගී ඒම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දෙවන ලෝක යුද්ධයෙන් පසුව උදා වූ තත්ත්වය විග්‍රහ කරන්න. (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) යුරෝපා සම්මේලන ක්‍රමය

(ii) වයිමාර් සමූහාණ්ඩුව

(iii) ජෝශප් ස්ටාලින්

(iv) තුෂ්ණි යුද්ධය

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 25B - යුරෝපා ඉතිහාසය

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

## 25 B - යුරෝපා ඉතිහාසය

### ලකුණු බෙදී යාමේ ආකාරය

I පත්‍රය 01 x 40 = 40

II පත්‍රය

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 12 |
| සෙසු ප්‍රශ්න 3 කට 16 බැගින් | = | 48 |
| II පත්‍රය අවසාන ලකුණු | = | 60 |

අවසාන ලකුණු = 40 + 60 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................
..................................................
.................................................. √ △ $\frac{4}{5}$

(ii) ..................................................
..................................................
.................................................. √ △ $\frac{3}{5}$

(iii) ..................................................
..................................................
.................................................. √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

## බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂයය අංකය / பாட இலக்கம்: **25 B**

විෂයය / பாடம்: **යුරෝපා ඉතිහාසය**

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 5 | 21. | 2 | 31. | 4 |
| 02. | 1 | 12. | 2 | 22. | 5 | 32. | 3 |
| 03. | 4 | 13. | 5 | 23. | 4 | 33. | 2 |
| 04. | 1 | 14. | 3 | 24. | 3 | 34. | 1 |
| 05. | 2 | 15. | 4 | 25. | 1 | 35. | 5 |
| 06. | 5 | 16. | 3 | 26. | 2 | 36. | 3 |
| 07. | 3 | 17. | 5 | 27. | 4 | 37. | 2 |
| 08. | 4 | 18. | 2 | 28. | 5 | 38. | 1 |
| 09. | 1 | 19. | 4 | 29. | 1 | 39. | 5 |
| 10. | 2 | 20. | 1 | 30. | 3 | 40. | 4 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

25 B | S | II

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**

* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක් I** කොටස සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) බෝල්ටික් මුහුද | (ii) කෝසිකා | (iii) ඇතන්ස් |
| (iv) ස්පාඤ්ඤය | (v) ඩැනියුබ් ගඟ | (vi) ලන්ඩන් |
| (vii) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය | (viii) උතුරු මුහුද | (ix) ඉස්තාන්බුල් |
| (x) ශාන්ත පීටර්ස්බර්ග් | (xi) ඩැන්සිග් | (xii) කීල් ඇළ |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

## B කොටස

**2.** (i) පුරාණ රෝමවරුන් අතර පැවති විවිධ ආණ්ඩුක්‍රමවල දක්නට ලැබුණ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

(ii) සාහිත්‍යය සහ ගෘහ නිර්මාණ ශිල්පය යන ක්ෂේත්‍රවල පුරාණ රෝමවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධනයන් පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

**3.** "දේශ ගවේෂණ වූ කලී විවිධාකාර වූ ආර්ථික, දේශපාලන සහ ආගමික හේතු සමූහයක ප්‍රතිඵලයකි."

(i) දේශ ගවේෂණවලට මුල පිරූ අයිබීරියානු රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) එම රටවල මූල්කාලීන ගවේෂණවලට අනුග්‍රහය දැක්වූ පාලකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) එම රටවල් අතුරෙන් **එකක්** නිරත වූ මූල්කාලීන ගවේෂණ සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)

(iv) පහළොස්වන සියවසේ දෙවන භාගයේ දී හා දහසයවන සියවසේ මුල් භාගයේ දී ඇති වූ දේශ ගවේෂණවලට තුඩුදුන් ප්‍රධාන ආර්ථික, දේශපාලන හා ආගමික හේතු විචාරාත්මකව විමසන්න. (ලකුණු 09 යි)

**4.** (i) 'කාර්මික විප්ලවය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) කාර්මික විප්ලව සමයේ දී බිහි වූ ප්‍රධාන නව උත්පාදන සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවය එංගලන්තයේ ඇතිවීමට තුඩුදුන් ආර්ථික හා සමාජ තත්ත්වයන් විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම

(ii) ඉතාලි පුනරුදය ඇති වූ පසුබිම

(iii) ප්‍රති රෙපරමාදුව

(iv) තිස් අවුරුදු යුද්ධය

(ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

**6.** "ආඥාදායක පාලනයක් ගෙනගිය ද නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන කාර්ය සාධනයන් ආරක්ෂා කළේ ය, ශක්තිමත් කළේ ය, ඒ අතර ම ඒවා වෙනත් රටවලට ගෙන ගියේ ය."

(i) නැපෝලියන් බොනපාර්ට් උපන් ස්ථානය නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) නැපෝලියන් බොනපාර්ට් බලයට පත්වීමට පෙර විප්ලව සමයේ ප්‍රංශයේ පැවති **එක්** ආණ්ඩු ක්‍රමයක් නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ පාලකයා බවට පත් වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ ක්‍රියාත්මක කළ දේශීය ප්‍රතිපත්තිය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 10 යි)

**7.** (i) 1815 සිට 1848 දක්වා කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමට එරෙහිව පැවති බාධක විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) ඉතාලිය එක්සත් කිරීමෙහි ලා කැවූර් සහ ගැරිබෝල්ඩි විසින් ඉටුකරන ලද කාර්යභාරයන් පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

**8.** සුපිරි බලවතුන්ගේ නැගී ඒම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දෙවන ලෝක යුද්ධයෙන් පසුව උදා වූ තත්ත්වය විග්‍රහ කරන්න. (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) යුරෝපා සම්මේලන ක්‍රමය

(ii) වයිමාර් සමූහාණ්ඩුව

(iii) ජෝශප් ස්ටාලින්

(iv) කුෂ්ණි යුද්ධය

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| යුරෝපා ඉතිහාසය II<br>ஐரோப்பிய வரலாறு II<br>History of Europe II | 25 B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ....................



අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024

ඉතිහාසය II (II කොටස)

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස්:

- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස සමග සපයා ඇත.)

A කොටස

(1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) බෝල්ටික් මුහුද (ii) කෝසිකා (iii) ඇතන්ස් (iv) ස්පාඤ්ඤය
(v) ඩැනියුබ් ගඟ (vi) ලන්ඩන් (vii) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය (viii) උතුරු මුහුද
(xi) ඉස්තාන්බුල් (x) ශාන්ත පීටර්ස්බර්ග් (xi) ඩැන්සිග් (xii) කීල් ඇළ

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)

B කොටස

2. (i) පුරාණ රෝමවරුන් අතර පැවති විවිධ ආණ්ඩුක්‍රමවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

❖ ආණ්ඩුක්‍රම විකාශයේ අවස්ථා තුනකි:

1. රාජාණ්ඩුව (ක්‍රි.පූ. 753 පමණ සිට 510 දක්වා)
2. සමූහාණ්ඩුව (ක්‍රි.පූ. 510 සිට 27 දක්වා)
3. අධිරාජ්‍යය (ක්‍රි.පූ. 27 සිට 476 දක්වා).

### ❖ රාජාණ්ඩුව

- මුල්ම ආණ්ඩුක්‍රමය වූ මේ ක්‍රමයේදී රජුට ප්‍රධාන පූජක, ප්‍රධාන විනිසුරු හා සියලු නිලධාරීන් පත්කිරීමේ බලය ආදී පුළුල් බලතල හිමිවීම.
- මෙම ආණ්ඩු ක්‍රමය ක්‍රි.පූ. 753 පමණ සිට ක්‍රි.පූ. 510 පමණ දක්වා ක්‍රියාත්මක වීම.
- රජුට විශාල බලතල ප්‍රමාණයක් හිමිව තිබූ නමුත් එම බලතල සම්ප්‍රදාය මගින් සීමා කිරීම - රජුට පහළින් වැඩිහිටි සභාව හෙවත් සෙනෙට් සභාව පැවතීම. වැදගත් තීරණ ගැනීමේදී රජු මෙම සභාව විමසිය යුතු වීම.
- රජකෙනෙකුගේ පත්වීම ජනතාව විසින් අනුමත කළ යුතුව තිබූ නමුත්, ඔහු බලයෙන් පහ කිරීමට කිසිවෙකුටත් අයිතියක් නොතිබීම.
- රජු හා සෙනෙට් සභාවට අමතරව මහජන සභාවක් පැවතීම සහ යුධ සේවයට සුදුසු සියලු පුරුෂයන් එහි සාමාජිකත්වය දැරීම.
- දේශපාලන බලතල හා අවස්ථා ඉඩම් හිමි ප්‍රභූන්ට (පැට්‍රීෂියන්වරුන්ට) පමණක් හිමිවීම.
- පැට්‍රීෂියන්වරුන් විසින් අවසන් රෝම රජු වූ උඩඟු ටාර්ක්වින් නෙරපා සමූහාණ්ඩුවක් පිහිටුවීම.

### ❖ සමූහාණ්ඩුව

- ක්‍රි.පූ. 510-27 අතර කාලයේ ක්‍රියාත්මක වීම.
- රජුට හිමිව තිබූ සිවිල් හා හමුදා බලතල, වසර දෙකක් වූ ධුර කාලයක් සඳහා පත් වූ කොන්සල්වරුන් දෙදෙනෙකුට පැවරීම.
- මේ දෙදෙනාට එකිනෙකාගේ තීරණවලට විරුද්ධ විය හැකිවීම (එක් අයෙකු ඒකාධිපතියෙකු වීම වැළැක්වීමට ගත් පියවරකි).
- විධායක කටයුතුවලදී ඔවුන්ගේ සහායට මහේස්ත්‍රාත්වරුන් හා පරිපාලකයන් වාර්ෂිකව පත්කරගැනීම. එම කාර්යය සෙන්චූරියේට් සභාව නම් සභාව මගින් සිදුකිරීම. නීති පැනවීමද එම සභාව මගින් සිදුකිරීම. එම සභාවේ තීරණවලට සෙනෙට් සභාවේ අනුමැතිය අනිවාර්ය වීම.
- ආණ්ඩුක්‍රමයේ බලවත්ම අංගය සෙනෙට් සභාව වීම (මූල්‍ය හා විදේශ කටයුතු පිළිබඳ බලය). සාමාජිකත්වය පැට්‍රීෂියන්වරුන්ට පමණක් හිමිවීම.
- පැට්‍රීෂියන් බලයට එරෙහිව දිගු කලක් තිස්සේ සාමාන්‍ය ජනතාව (ප්ලිබියන්වරුන්) ගෙනගිය අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ප්ලිබියන්වරුන්ගේ සභාවක්ද පිහිටුවීම.
- පසුව කොන්සල් තනතුරු දෙකෙන් එකක් ඔවුන්ට ලබාදීමට සිදුවීම.
- මෙකල රෝම බලය විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වීම.
- කොන්සල්වරුන් අතර ගැටුම, බලලෝභී සෙන්පතියන් මතුවීම ආදිය හේතුකොටගෙන මෙම ක්‍රමය බිඳවැටීම.

❖ **අධිරාජ්‍ය පාලනය**

- ක්‍රි.පූ. 27 සිට ක්‍රි.ව. 476 පමණ දක්වා පැවතීම.
- ක්‍රි.පූ. 27 දී බලයට පත් ඔක්ටේවියස් (ඔගස්ටස්) රෝමයේ පළමුවන අධිරාජයා වීම. ඔහු පරම, ඒකාධිපති පාලනයක් ඇති කිරීම.
- අධිරාජයා වෙත සියලු බලතල කේන්ද්‍රගත වීම.
- නාමික වශයෙන් බලවත් වූ සෙනෙට් සභාව (ඇතැම් පළාත් පරිපාලනයට තිබූ බලය හා සීමිත මූල්‍ය බලතල), අධිරාජයාට උපදෙස් දෙන ආයතනයක් පමණක් බවට පත්වීම.
- රෝම බල ව්‍යාප්තියේ උච්චතම අවස්ථාව මෙකල සනිටුහන් වීම.
- මෙම අවධියේදී රෝම අධිරාජ්‍යය බටහිර හා නැගෙනහිර වශයෙන් කොටස් දෙකකට බෙදීම.

**(ලකුණු 08 යි)**

**(ii) සාහිත්‍යය සහ ගෘහ නිර්මාණ ශිල්පය යන ක්ෂේත්‍රවල පුරාණ රෝමවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධනයන් පරීක්ෂා කරන්න.**

❖ **සාහිත්‍යය**

- සාහිත්‍ය අංශයේ දියුණු අවධියක් වීම.
- වර්ජිල්ගේ නිර්මාණ - *ඊනිඩ් මහාකාව්‍යය, එක්ලොග්ස්* හා *ජෝර්ජික්ස්* කාව්‍ය.
- හොරස් නම් ගී කාව්‍ය රචකයා - ගීත කාව්‍ය, උපහාසාත්මක කාව්‍ය ආදිය.
- ඕවිඩ් කවියා - *මෙටමොෆොසිස්* කාව්‍යය.
- ජුවෙනල්, ප්ලෝටස් යන කවියන්.
- ඉතිහාසය කෘති - ලිවීගේ *රෝමයේ ඉතිහාසය* සහ ටැසිටස්ගේ *හිස්ටරීස්.*

❖ **ගෘහ නිර්මාණ ශිල්පය**

- රෝම ගෘහ නිර්මාණ ශිල්පය ඉතා දියුණු එකක්ව පැවති අතර එය පසුකාලීන යුරෝපයේ නිර්මාණ කෙරෙහිද ඉමහත් බලපෑමක් ඇති කිරීම.
- ක්‍රීඩාගාර - කොලෝසියම.
- මාළිගා - ඩයක්ලීෂියන් මාළිගය.
- නාන තටාක - ඩයක්ලීෂියන් හා කැරකැල්ලා අධිරාජයන්ගේ සමයේ නිර්මාණය කරන ලද පොදු නාන තටාක.
- මාළිගා - ඔගස්ටස් සීසර් හා ඩොමිෂියන් ආදී අධිරාජයන්ගේ මාළිගා.
- රෝම ගෘහයන් ඇට්‍රියම් (විශාල මැද මිදුලකට සමාන කොටස), අල්කාරය (නිවසේ දෙවියන් වන්දනාව සඳහා වූ ස්ථානය), පෙරිස්ටයිල් (මැද මිදුලක් හෝ ගෙඋයනක් වටා ඉදිකරන ලද කුළුණු පෙළ) හා ආලින්ද වැනි අංගෝපාංගවලින් මෙන්ම සඳළුතල, සොල්දර වැනි අංගවලින්ද සමන්විත විය.
- පොදු ගොඩනැගිලි - වැසිකිළි, කැසිකිළි, නාන කාමර.
- විශේෂ ලක්ෂණ - ශිඛර ගෝලාර්ධ හා ආරුක්කු.
- අලංකාරය මෙන්ම ශක්තිය හා උපයෝගිතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම.

**(ලකුණු 08 යි)**

3. "දේශ ගවේෂණය වූ කලී විවිධාකර වූ ආර්ථික, දේශපාලන සහ ආගමික හේතු සමූහයක ප්‍රතිඵලයකි."

(i) දේශ ගවේෂණවලට මුල පිරූ අයිබීරියානු රටවල් දෙක නම් කරන්න.

ස්පාඤ්ඤය, පෘතුගාලය

(ලකුණු 02 යි)

(ii) එම රටවල මුල්කාලීන ගවේෂණවලට අනුග්‍රහය දැක් වූ පාලකයන් දෙදෙනෙකු නම් කරන්න.

නාවික හෙන්රි, ෆර්ඩිනන්ඩ්-ඉසබෙලා යුවල, VII හෙන්රි, VIII හෙන්රි

(ලකුණු 02 යි)

(iii) එම රටවල් අතුරෙන් එකක් නිරත වූ මුල්කාලීන ගවේෂණ සැකෙවින් දක්වන්න.

♦ ස්පාඤ්ඤය

- ක්‍රිස්ටොෆර් කොලම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩබැසීම
- අමෙරිගෝ වෙස්පූචි - අමෙරිකා මහද්වීපයට ගොඩ බැසීම
- හර්නැන්ඩෝ කෝර්ටීස් - මෙක්සිකෝව ජයගැනීම
- ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පේරු දේශය ජයගැනීම
- ෆර්ඩිනන්ඩ් මැගලන් - ලොව වටා යාත්‍රා කිරීම; පසුව පිලිපීන දූපත් යටත් කරගැනීම
- මධ්‍යම ආසියාවේ සහ දකුණු අමෙරිකාවේ විශාල ප්‍රදේශයක ව්‍යාප්තිත අධිරාජ්‍යයක් ගොඩනැගීම.

(ලකුණු 03 යි)

❖ පෘතුගාලය

- බටහිර අප්‍රිකාවේ ගෝල්ඩ්කෝස්ට් හා කොංගෝ නදියේ මුවදොර තෙක් යාත්‍රා කිරීම.
- බර්තොලමියු දියෙස් සුබ පැතුමේ තුඩුව දක්වා යාත්‍රා කිරීම.
- වස්කෝ ද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩබැසීම.
- කබ්රාල් බ්‍රසීලයට යාත්‍රා කිරීම.
- බ්‍රසීලයේ බලය පිහිටුවාගැනීම.
- ආසියාවේ ඉතා පුළුල් ප්‍රදේශයක විසිරී ගිය කුඩා ස්ථානවලින් යුත් පෙරදිග අධිරාජ්‍යයක් ගොඩනැගීම.

(ලකුණු 03 යි)

**(iv) පහළොස්වන සිවවස දෙවන භාගයේ දී හා දහසයවන සියවස මුල් භාගයේ දී ඇති වූ දේශ ගවේෂණවලට තුඩුදුන් ප්‍රධාන ආර්ථික, දේශපාලන හා ආගමික හේතු විචාරාත්මකව විමසන්න.**

❖ **ආර්ථික**

- 1453 කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත්වීමෙන් පසුව පෙරදිග සිට යුරෝපයට වැටී තිබුණු වෙළෙඳ මාර්ග අවහිරවීම නිසා හටගත් වෙළඳ අර්බුදයට විසඳුමක් සෙවීම.
- ආසියාතික වෙළඳ ද්‍රව්‍ය යුරෝපයට ගෙනැවිත් අළෙවිකොට ලාභ ලබාගැනීමේ අපේක්ෂාව හා ඒ සඳහා වෙළෙඳ මාර්ගයක් සොයාගැනීමට පෙළඹීම.

❖ **දේශපාලන**

- ජාතික රාජ්‍යවල නැගීම හා එම රාජ්‍යවල පාලකයන්ගේ අනුග්‍රහය ලැබීම.
- ජාතික රාජ්‍ය අතර හටගත් තරගය.

❖ **ආගමික**

- මුස්ලිම් ආධිපත්‍යය මර්දනය කිරීම.
- කතෝලික දහම ව්‍යාප්ත කිරීම.

**(ලකුණු 09 යි)**

**4. (i) 'කාර්මික විප්ලවය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?**

භාණ්ඩ නිෂ්පාදන කාර්යය ගෘහස්ත සීමාවෙන් කර්මාන්තශාලා වෙත මාරුවීම හා හස්ත කර්මාන්ත වශයෙන් පැවති නිෂ්පාදන ක්‍රියාවලිය සත්ව/යන්ත්‍රසූත්‍රවල බලය භාවිතය වෙත යොමුවීම මගින් නිෂ්පාදන කටයුතු මහා පරිමාණයෙන්, වේගවත්ව හා අතිරික්තයක් සහිතව වෙළෙඳපල ඉලක්ක කොටගෙන සිදුවීම. මේ තුළ ආර්ථික, සමාජ, තාක්ෂණික හා නිෂ්පාදන ක්ෂේත්‍රවල රැඩිකල් පරිවර්තනයක් ඇතිවීම.

**(ලකුණු 04 යි)**

**(ii) කාර්මික විප්ලව සමයේ දී බිහි වූ ප්‍රධාන නව උත්පාදන සැකෙවින් දක්වන්න.**

සැලෙන නඩාව, කටින ජෙනිය (ස්පිනිං ජෙනී), කටින මියුලය (ස්පිනිං මියුල්), ජල රාමුව, වාෂ්ප ඇන්ජිම, දුම්රිය ඇන්ජිම, ආරක්ෂක ලාම්පුව, අවශෝෂන පංකාව.

**(ලකුණු 02 යි)**

**(iii) කාර්මික විප්ලවය එංගලන්තයේ ඇතිවීමට තුඩුදුන් ආර්ථික හා සමාජ තත්ත්වයන් විශ්ලේෂණය කරන්න.**

❖ එංගලන්තයේ විදේශ වෙළඳාම පුළුල් වී යාම.

❖ භාණ්ඩ ඉල්ලුම වැඩි වීම හා ඒ හේතුකොටගෙන නිෂ්පාදනය වැඩිකිරීමේ අවශ්‍යතාව මතුවීම.

❖ එංගලන්තය තුළ විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම වර්ධනය වීම.

❖ වෙළෙඳාම වර්ධනය වීම හේතුකොටගෙන මූලධනයක් උපයාගෙන සිටි ධනවතුන් පිරිසක් කර්මාන්ත අංශයේ ආයෝජනයට ඉදිරිපත් වීම.

❖ කෘෂිකාර්මික විප්ලවය (දෙවැනි ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය) නිසා ඉඩම් අහිමි හා රැකියා විරහිත පිරිසක් බිහිවීම හා ඔවුන් රැකියා සොයා නගරවලට සංක්‍රමණය වීම. මේ හේතුකොටගෙන කාර්මික අංශය සඳහා ශ්‍රම සුලභතාවක් නිර්මාණය වීම.

❖ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම.

**(ලකුණු 10 යි)**

**5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම <u>දෙකක</u> ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

**(i) බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම**
**(ii) ඉතාලි පුනරුදය ඇති වූ පසුබිම**
**(iii) ප්‍රති රෙපරමාදුව**
**(iv) තිස් අවුරුදු යුද්ධය**

**(ලකුණු 2×8=16 යි)**

**(i) බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම**

❖ බිඳවැටීමට අභ්‍යන්තර මෙන්ම බාහිර සාධක බලපා ඇත.

❖ **අභ්‍යන්තර සාධක**

<u>දේශපාලන</u>

- ආරක්ෂා කරගැනීම දුෂ්කර වන තරමට අධිරාජ්‍යය විශාල වීම.
- දුර්වල අධිරාජයන් බිහිවීම.
- සෙන්පතියන් ඇතුළු දේශපාලන බලවතුන් අතර බල තරගය.
- හමුදා දුර්වල වීම (විනය පිරිහීම, ම්ලේච්ඡයන් කුලී හටයන් වශයෙන් බඳවාගැනීම).

<u>ආර්ථික</u>

- කෘෂිකර්මාන්තය පිරිහීම (නිදහස් ගොවි පංතිය දුර්වල වීම, වහල් ශ්‍රමය පදනම් කරගත් 'විලාස්' ගොවිපළ ක්‍රමය).
- ජනතාවට දැරිය නොහැකි බදු.

<u>සමාජ</u>

- පවුල් ඒකකය පිරිහීම හා එමගින් සමාජයේ හටගත් පරිහානිය.

❖ **බාහිර සාධක**

මෙසේ අභ්‍යන්තර වශයෙන් පරිහානියට පත්ව තිබියෙදී බටහිර රෝම අධිරාජ්‍යයට බාහිරින් ම්ලේච්ඡ ආක්‍රමණ එල්ලවීම. එම අවස්ථාවේදී බටහිර ආරක්ෂා කිරීමට නැගෙනහිර රෝම අධිරාජ්‍යය අපොහොසත් වීම.

**(ලකුණු 08 යි)**

**(ii) ඉතාලි පුනරුදය ඇති වූ පසුබිම**

❖ ඉතාලියේ පුනරුදය ඇතිවීමට අභ්‍යන්තර මෙන්ම බාහිර සාධක ද තුඩු දී ඇත.

❖ **අභ්‍යන්තර සාධකඃ**

- බටහිර යුරෝපයේ අන් කවර ප්‍රදේශයකවත් දක්නට නොලැබුණු අන්දමේ සම්භාව්‍ය සම්ප්‍රදායයක් ඉතාලියේ ශේෂව පැවතීම.
- ඉතාලි විශ්වවිද්‍යාලවල දේවධර්මයට වඩා නීතිය, වෛද්‍ය විද්‍යාව වැනි ලෞකික විෂයයන් හැදෑරීමට නැඹුරුවක් පැවතීම. මේ නිසා ලෞකිකත්වයට හා තර්කනයට වැඩි වැදගත්කමක් ලැබීම.
- ඉතාලිය තුළ පැවති සමාජ-ආර්ථික පසුබිමඃ
  විශේෂයෙන් කුරුස යුද්ධවලින් පසු වෙළෙඳ හා වාණිජ කටයුතු වර්ධනය වීම; එහි ප්‍රතිඵලයක් ලෙස යුරෝපයේ වෙනත් රටවලට වඩා වැඩවසම් ක්‍රමයත් රදළ බලයත් දුර්වල වී පැවතීම හා ධනවත් මධ්‍යම පන්තියක් වර්ධනය වීම; එම ධනවතුන් කලා කටයුතුවලට අනුග්‍රහ දැක්වීම හා කලා රසවින්දනය සඳහා අවශ්‍ය විවේකය හා හැකියාව ඔවුන් සතුව තිබීම. ගිහි ප්‍රභූන් පමණක් නොව පාප් වහන්සේද කලාකරුවන්ට හා කලා කටයුතුවලට අනුග්‍රහ දැක්වීම.

❖ **බාහිර සාධකඃ**

- නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ කොන්ස්තන්තිනෝපලයේ තිබූ දැනුම (පොතපත) හා ඥානය (උගතුන්) එහි සිට ඉතාලියට විසරණය වීම.
- 1453 දී කොන්ස්තන්තිනෝපලය ඔටෝමන් තුර්කීන් අතට පත්වීමත් සමග මෙම ක්‍රියාවලිය වේගවත් වීම.

**(ලකුණු 08 යි)**

**(iii) ප්‍රති රෙපරමාදුව**

❖ ප්‍රොතෙස්තන්ත්‍රවාදයට එරෙහිව කතෝලික සභාවෙන් එල්ල වූ ප්‍රතික්‍රියාව ප්‍රති රෙපරමාදුව නමින් හැඳින්වේ.

❖ අරමුණුඃ

- ප්‍රොතෙස්තන්ත්‍රවාදීන්ගේ ආගමික මතවාද බිඳදැමීම.
- ප්‍රොතෙස්තන්ත්‍රවාදය ව්‍යාප්ත වීම වැළැක්වීම.
- කතෝලික සභාවේ බලය යළි පිහිටුවීම.

❖ ප්‍රධාන අංගඃ

- ජේසුයිට් නිකාය
- ට්‍රෙන්ට් සම්මේලනය
- අධර්ම මර්දනාධිකරණය

**(ලකුණු 08 යි)**

**(iv) තිස් අවුරුදු යුද්ධය**

❖ ක්‍රි. ව. 1618 සිට 1648 දක්වා ජර්මනිය මුල් කරගෙන පැවති යුද්ධය මේ නමින් හැඳින්වේ.

❖ කතෝලිකයන් හා ප්‍රොතෙස්තන්තුවාදීන් අතර ගැටුම් පැවතීම.

❖ 1595 ඔග්ස්බර්ග් සාම සමථයෙන් මෙම ගැටුම විසඳීමට උත්සාහ ගෙන තිබුණත් ලූතර්වාදය පමණක් පිළිගැනීම හේතුකොටගෙන එම විසඳුම අසාර්ථක වීම.

❖ මේ පසුබිම තුළ කතෝලිකයන් සහ පසුකාලීනව නැගී ආ කැල්වින්වාදීන් අතර ජර්මානු ප්‍රදේශ තුළ ගැටුම් ඇතිවීම හේතුකොටගෙන තිස් අවුරුදු යුද්ධය ආරම්භවීම.

❖ මේ වනවිට බලවත් වෙමින් පැවති යුරෝපා රාජ්‍ය අතර බල අරගලයක් බවට මෙම ආගමික ගැටුම පරිවර්තනයවීම හා ඒ හේතුකොටගෙන මෙම යුද්ධය වසර 30 ක් තිස්සේ පැවතීම.

❖ අවස්ථා:

1. බොහිමියානු පැලටයින් අවධිය (1618-20)
2. ඩෙන්මාර්ක්/ඩේනිෂ් අවධිය (1625-29)
3. ස්වීඩන්/ස්වීඩිෂ් අවධිය (1630-35)
4. ප්‍රංශ අවධිය (1635-48)

❖ 1648 එළඹුණ වෙස්ට්ෆේලියානු සාම ගිවිසුම මගින් යුද්ධය අවසන් කිරීම.

❖ ප්‍රතිඵල:

- ප්‍රංශ පිල ජයගත් අතර එතෙක් පැවති ශුද්ධ රෝම අධිරාජ්‍යය හුදු නාමික අධිරාජ්‍යයක් බවට පත්වීම.
- යුරෝපයේ ඇති වූ අවසන් ආගමික යුද්ධය සේ සලකනු ලැබේ.

**(ලකුණු 08 යි)**

## C කොටස

6. **"ආඥාදායක පාලනයක් ගෙනගිය ද නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන කාර්ය සාධනයන් ආරක්ෂා කළේ ය. ඒ අතර ම ඒවා වෙනත් රටවලට ගෙන ගියේ ය."**

**(i) නැපෝලියන් බොනපාර්ට් උපන් ස්ථානය නම් කරන්න.**

කෝසිකා දූපත

**(ලකුණු 01 යි)**

**(ii) නැපෝලියන් බොනපාර්ට් බලයට පත්වීමට පෙර විප්ලව සමයේ ප්‍රංශයේ පැවති <u>එක්</u> ආණ්ඩු ක්‍රමයක් නම් කරන්න.**

ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුව, සමූහාණ්ඩුව (ගිරොඩින් පාලන සමය/ජැකොබින් පාලන සමය), ඩිරෙක්ටරි හෙවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය.

**(ලකුණු 01 යි)**

**(iii) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ පාලකයා බවට පත් වූ ආකාරය සැකෙවින් දක්වන්න.**

❖ 1769 දී උපත ලැබූ නැපෝලියන් බොනපාට් ප්‍රංශයට පැමිණ පැරිසියේ හමුදා විද්‍යාලයේ ලැබූ අධ්‍යාපනයෙන් පසුව, කාලතුවක්කු හමුදාවේ නිලධාරියෙකු බවට පත්වීම.

❖ 1793 දෙසැම්බර් - ටූලෝං වරායට එල්ල වූ ඉංග්‍රීසි ප්‍රහාරය සාර්ථක ලෙස මැඩ පැවැත්වීම.

❖ 1796 - ඉතාලිය ආක්‍රමණය කිරීමට යවන ලද ප්‍රංශ හමුදාවේ අණදෙන නිලධාරියා වීම (මිසර ආක්‍රමණය අසාර්ථක වුවත් නැපෝලියන්ගේ ජනප්‍රියත්වය දිගටම පැවතීම).

❖ 1799 නොවැම්බර් - එවකට පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය පෙරළා දැමීමට සහයෝගය දැක්වීම.

❖ 1799 - පළමුවන කොන්සල්වරයා බවට පත්වීම.

❖ 1802 - යාවජීව කොන්සල්වරයා බවටත් පත්වීම.

❖ 1804 - ප්‍රංශ අධිරාජයා බවට පත්වීම.

**(ලකුණු 04 යි)**

**(iv) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ ක්‍රියාත්මක කළ දේශීය ප්‍රතිපත්තිය විවේචනාත්මකව විමසන්න.**

**ආණ්ඩුක්‍රමය:**

❖ ව්‍යවස්ථාදායක, විධායක හා පරිපාලන බලතල පළමුවන කොන්සල්වරයා (පසුව අධිරාජයා) වෙත සංකේන්ද්‍රගත කරන ලද ඒකාධිපති පාලන ක්‍රමයක් පිහිටුවා ගැනීම.

❖ ජනවිචාරණ මගින් තම ප්‍රතිපත්ති හා වැඩපිළිවෙලවලට මහජන අනුමැතිය ලබාගැනීම.

❖ පළාත් පාලන ඒකකවලට මධ්‍යම ආණ්ඩුවෙන් නිලධාරීන් පත් කිරීම (ප්‍රිෆෙක්ට්වරුන්).

❖ පරිපාලන ඒකාබද්ධතාවක් ඇති කිරීම.

❖ දක්ෂතා අනුව තනතුරුවලට පත්වීමේ හා උසස්වීමේ ඉඩ ප්‍රස්ථා ලබාදීම.

❖ නීතිය ඉදිරියේ සමානාත්මතාව, පුද්ගලික දේපළ හිමිකම, අඩවහල් ක්‍රමය අහෝසි කිරීම, ආදී විප්ලවයේ අරමුණු හා මූලධර්ම ආරක්ෂා කිරීම හා ඒවාට නීත්‍යානුකූල පදනමක් ලබාදීම.

❖ එසේ වුවත් ප්‍රංශ විප්ලවයේ ඇතැම් ලිබරල් අරමුණු නොසලකා හැරීම.

**අධ්‍යාපනය**

❖ ද්විතීයික අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා ලයිසීස් නම් අධ්‍යාපන ආයතන පිහිටුවීම

❖ තම බලය තහවුරු කරගැනීමට අධ්‍යාපනය යොදාගැනීම (පක්ෂපාතී පුරවැසියන් නිර්මාණය කිරීම).

❖ ස්වභාවික විද්‍යා හැදෑරීම ධෛර්යමත් කිරීම. විද්‍යාව, ගණිතය යන විෂයයන් පාසල්වල ඉගැන්වීමට නියම කිරීම.

❖ ඉතිහාසය, දේශපාලන විද්‍යාව, දර්ශනය වැනි විෂයයන් පාසැල් විෂය මාලාවෙන් ඉවත් කිරීම.

**ආගම**

❖ ආගමික සංවිධානය රජය යටතට ගැනීම.

❖ 1801 දී පාප්වරයා සමඟ කොන්කෝඩට් ගිවිසුම ඇති කර ගැනීම.

❖ රෝමානු කතෝලික ආගම රාජ්‍යාගම ලෙස පිළිගැනීම.

**අධිකරණ කටයුතු**

❖ රටටම පොදු අධිකරණ ක්‍රමයක් ඇති කිරීම.

❖ නැපෝලියානු නීති සංග්‍රහය සංගෘහිත කොට ක්‍රියාත්මක කිරීම.

❖ 'ලෙත්‍රෙ දි කැචේ' නම් වරෙන්තු ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

**ආර්ථික ප්‍රතිපත්ති**

❖ ඒකීය මුදල් ක්‍රමයක් සහ බැංකු ක්‍රමයක් පිහිටුවීම.

❖ ආනයන භාණ්ඩ සඳහා අධික තීරු ගාස්තු අය කිරීම.

❖ ප්‍රංශයේ ගොවිතැන හා කර්මාන්ත දියුණු කිරීම.

❖ ආහාර මිල පාලනය කිරීම.

❖ 1800 දී ප්‍රංශ මහ බැංකුව පිහිටුවීම.

❖ ගොවීන්ට නිත්‍යානුකූලව ඉඩම් පවරා දීම.

❖ ඒකීය බදු ක්‍රමයක් ඇති කිරීම.

❖ කර්මාන්ත දියුණුකිරීම සඳහා අනුබල දීම.

**මහජන සේවා**

❖ ලූවර් කෞතුකාගාරය ඉදිකරවීම.

❖ මංමාවත් හා ඇළමාර්ග සංවර්ධනය කිරීම.

❖ නගර අලංකරණය කිරීම.

මෙකී ක්‍රියාමාර්ග ප්‍රංශ විප්ලවයේ අරමුණුවලට කෙතෙක් දුරට එකඟ වීද නැතිනම් එරෙහි වීද යන්න කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා කර තිබේ නම් වැඩි ලකුණු ලබාදිය යුතුය.

**(ලකුණු 10 යි)**

**7. (i) 1815 සිට 1848 දක්වා කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමට එරෙහිව පැවති බාධක විස්තර කරන්න.**

❖ රාජ්‍ය ගණනාවකට බෙදී පැවතීම ('ඉතාලිය යනු භූගෝලීය ප්‍රකාශයක් පමණකි' - මෙටර්නික්) හා ඒවා බොහොමයක් විදේශාධිපත්‍යය යටතේ පැවතීම.

❖ ඔස්ට්‍රියානු බලය සහ ආධිපත්‍යය.

❖ වියනා සමරුයේ තීරණවලින් යුරෝපා රටවල් බැඳී සිටීම.

❖ පාප් වහන්සේගෙන් එල්ල වූ විරෝධය (මෙම විරෝධය වඩාත් උග්‍ර වූයේ 1848 න් පසුවය).

❖ ඉතාලි ජාතිකයන් අතර ඉතාලි ජාතිකත්වය ප්‍රමාණවත් ලෙස පැතිරගොස් නොතිබීම.
❖ එක්සත් කිරීම සම්බන්ධයෙන් තනි වැඩපිළිවෙලක්/ව්‍යාපාරයක් වෙනුවට විවිධ වැඩපිළිවෙලවල්/ක්‍රියාමාර්ග ඉදිරිපත් වීම (මැසිනිගේ 'යෞවන ඉතාලිය' / නියෝ ගුවෙල්ෆ් ව්‍යාපාරය /ඇල්බෙටෝ ව්‍යාපාරය).

**(ලකුණු 06 යි)**

**(ii) ඉතාලිය එක්සත් කිරීමෙහි ලා කැවූර් සහ ගැරිබෝල්ඩි විසින් ඉටුකරන ලද කාර්යභාරයන් පරීක්ෂා කරන්න.**

❖ **කැවූර්:**

- ඉතාලිය එක්සත් කිරීම සම්බන්ධයෙන් වැඩිම කාර්යභාරයක් ඉටු කළ නායකයාය.
- පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ නායකත්වය යටතේ ඉතාලිය එක්සත් කළ යුතුය යන අදහස දරමින් ඒ අනුව ක්‍රියාත්මක වීම.
- පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ අගමැති ලෙස පත්වීම හා එය සංවර්ධනය කිරීමට හා ශක්තිමත් කිරීමට පියවර ගැනීම.
- මැසිනි මෙන් නොව ඉතාලිය එක්සත් කිරීමට, විශේෂයෙන් ඉතාලියේ පැවති ඔස්ට්‍රියානු බලය පළවා හැරීමට විදේශ ආධාර අවශ්‍ය බව කල්පනා කළ කැවූර්, ඒ සඳහා පියවර ගැනීම (ප්‍රංශයේ ලුවී නැපෝලියන්ගේ ආධාර ලබාගැනීමට පියවර ගැනීම).
- ලොම්බාර්ඩි හා මධ්‍යම ඉතාලි රාජ්‍ය යන ප්‍රදේශ පීඩ්මොන්ට් රාජ්‍යයට ඈඳාගැනීම.

❖ **ගැරිබෝල්ඩි:**

- සටන්කාමියෙකු වූ ගැරිබෝල්ඩි 'රතු කමිස හමුදාව' ගොඩනැගීම.
- දකුණු ඉතාලිය එහි සිටි පාලකයන්ගෙන් මුදවාගෙන, පීඩ්මොන්ට් රාජ්‍යය වෙත භාරදීම.

ඉතාලිය එක්සත් කිරීමෙහිලා මෙම නායකයින් දෙදෙනා ඉටු කළ කාර්යභාරය තුලනාත්මකව පරීක්ෂා කොට ප්‍රමාණ කිරීම සාර්ථක පිළිතුරකින් අපේක්ෂා කෙරේ.

**(ලකුණු 10 යි)**

**8. සුපිරි බලවතුන්ගේ නැගී ඒම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දෙවන ලෝක යුද්ධයෙන් පසුව උදා වූ තත්ත්වය විග්‍රහ කරන්න.**

- ❖ දෙවන ලෝක යුද්ධය අවසානයේදී එතෙක් මහා බලවතුන් වශයෙන් සිටි බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය අභිබවා සෝවියට් දේශය සහ අමෙරිකා එක්සත් ජනපදය සුපිරි බලවතුන් ලෙස නැගී ඒම.
- ❖ මේ බලවතුන් දෙදෙනා අතර මතභේද වර්ධනය වීම.
- ❖ යුද්ධයෙන් පසු ජර්මනිය නැවත ගොඩනැංවීම පිණිස සෝවියට් රුසියාව, අමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය හා ප්‍රංශය යටතේ ආරක්ෂක ජර්මනිය කලාප හතරකට බෙදීම.
- ❖ අ. එ. ජනපදය ප්‍රමුඛ බටහිර රටවල් තම භාරයේ පැවති කලාපවල ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පිහිටුවීමට අරමුණු කර ගැනීම. සෝවියට් දේශය, තමන් යටතේ පැවති කොටසෙන් ඉවත් නොවීම.
- ❖ මෙහි ප්‍රතිඵලය ලෙස ප්‍රජාතන්ත්‍රවාදී බටහිර ජර්මනියක් හා කොමියුනිස්ට්වාදී නැගෙනහිර ජර්මනියක් බිහිවීමට පසුබිම සකස්වීම.
- ❖ රුසියාව යටත් කරගෙන තිබූ නැගෙනහිර යුරෝපා රටවල කොමියුනිස්ට් පාලනය ස්ථාපනය කිරීම.
- ❖ කොමියුනිස්ට්වාදය ව්‍යාප්ත කිරීමේ උත්සාහයක සෝවියට් රුසියාව නිරත වීම හා අ. එ. ජනපදය ඊට එරෙහි වීම.
- ❖ යුරෝපයේ ආර්ථික අර්බුද සහිතව පැවති ඉතාලිය වැනි තවත් රටවල කොමියුනිස්ට් පක්ෂ බිහිවීම.
- ❖ මේ වන තෙක් මැදපෙරදිග කොමියුනිස්ට් ව්‍යාප්තිය වැළැක්වීමේ නිරතව සිටි බ්‍රිතාන්‍යය විසින් තුර්කි හා ග්‍රීක යුධ කඳවුරු පවත්වාගෙන යාමට එරටට ඇති වූ දුෂ්කරතාව දක්වමින් ඒවා අ. එ. ජනපදයට බාරදීම.
- ❖ යුරෝපයේ කොමියුනිස්ට් ව්‍යාප්තිය වළක්වන අරමුණ ඇතිව අ. එ. ජනපදය මාෂල් සැලැස්ම ක්‍රියාත්මක කිරීම; කොමියුනිස්ට ආක්‍රමණවලට එරෙහිව අමෙරිකානු ආධාර ලබාදීමේ අරමුණ ඇතිව ට්‍රෑමන් න්‍යාය ක්‍රියාත්මක කිරීම.
- ❖ අ. එ. ජනපදය ප්‍රමුඛ බටහිර හා සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර වශයෙන් ලෝකයේ රටවල් බොහොමයක් කඳවුරු දෙකකට වෙන්වීම.
- ❖ 1948 බර්ලින් අර්බුදය හා 1950 කොරියන් යුද්ධය.
- ❖ 1949 දී NATO සංවිධානය බටහිර කඳවුරේ යුධමය සංවිධානය වශයෙන් බිහිවීම හා ඊට ප්‍රතිචාර ලෙස සෝවියට් කඳවුරෙන් වෝර්සෝ සංවිධානය බිහිවීම.

**(ලකුණු 16 යි)**

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) යුරෝපා සම්මේලන ක්‍රමය
(ii) වයිමාර් සමූහාණ්ඩුව
(iii) ජෝශප් ස්ටාලින්
(iv) තුෂ්ණී යුද්ධය

(ලකුණු 2×8 = 16 යි)

**(i) යුරෝපා සම්මේලන ක්‍රමය**

- ❖ 1815 වියනා සම්මුතියෙන් ඇතිකොටගත් යුරෝපා සාමය පවත්වාගෙන යාම සඳහා මෙම ක්‍රමය ආරම්භ කිරීම.
- ❖ ඔස්ට්‍රියාව, රුසියාව, ප්‍රශියාව සහ එංගලන්තය මෙම ක්‍රමයේ ආරම්භක සාමාජිකයෝ වූහ.
- ❖ 1818 අයි-ලා-ෂැපෙල්, 1820 ට්‍රෝපෝ, 1822 ලයිබැක්, 1822 වෙරෝනා යන සම්මේලනවලදී සමකාලීන යුරෝපයේ විවිධ රටවල මතුව තිබූ කැළඹිලිවලට මැදිහත් වීමට උත්සාහ ගැනීම. උදා: ඉතාලිය, ස්පාඤ්ඤය, ග්‍රීක නිදහස් සටන
- ❖ සම්මේලන ක්‍රමය අසාර්ථක වූ නමුත් පසුකාලීනව, පළමු හා දෙවන ලෝක යුද්ධවලින් පසුව ජාත්‍යන්තර සංවිධාන පිහිටුවාගැනීමේදී මෙම ක්‍රමය ආදර්ශයට ගැනීම.

(ලකුණු 08 යි)

**(ii) වයිමාර් සමූහාණ්ඩුව**

- ❖ පළමුවන ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ පිහිටුවන ලද සමූහාණ්ඩුවයි (1919-33).
- ❖ ෆ්‍රෙඩ්රික් ඊබට් යටතේ 1918 නොවැම්බර් 9 දා බර්ලින්හිදී ප්‍රකාශයට පත් කෙරිණි.
- ❖ 1919 ජනවාරි - වෛමාර්හිදී රැස්වූ ජාතික මන්ත්‍රණ සභාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වීම.
- ❖ 1919-25 ප්‍රථම ජනාධිපති ඊබට්; 1925-34 හින්ඩෙන්බර්ග්.
- ❖ වර්සායි ගිවිසුමේ කොන්දේසි ඉටුකිරීමට අසමත්වීම.
- ❖ හිට්ලර් යටතේ නට්සිවාදය නැගී ඒම හා ඔහු බලවත් විපක්ෂයක් බිහි කිරීම; 1931 ජනාධිපතිවරණයෙන් ඔහු විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබාගැනීම.
- ❖ 1933 දී හින්ඩෙන්බර්ග් විසින් ජර්මන් චාන්සලර්වරයා වශයෙන් හිට්ලර් පිළිගැනීම.
- ❖ 1934 දී හින්ඩෙන්බර්ග්ගේ මරණයෙන් පසුව හිට්ලර් ජනාධිපතිවරයා බවට පත්වීම හා නට්සි ආණ්ඩුව පිහිටුවීම.

(ලකුණු 08 යි)

**(iii) ජෝශප් ස්ටාලින්**

❖ 1879 ජෝර්ජියාවේ උපත ලැබ, 1904 දී බොල්ෂෙවික් පක්ෂයට බැඳුන ජෝශප් ස්ටාලින් 1917 බොල්ෂෙවික් විප්ලවයට නායකයෙකු වශයෙන් කටයුතු කළේය.

❖ 1929 ලෙනින්ගේ මරණින් පසු කොමියුනිස්ට් පක්ෂයේ මහලේකම් පදවියට පත්වීම.

❖ සෝවියට් දේශයේ නායකත්වය සඳහා ට්‍රොට්ස්කි සමග තරඟයක් ඇතිකර ගැනීම (ස්ටාලින්ගේ 'තනි රටේ සමාජවාදය' හා ට්‍රොට්ස්කිගේ 'නොනවතින විප්ලවය' පිළිබඳ සංකල්ප එකිනෙකට ප්‍රතිවිරුද්ධ වීම.

❖ 1929 දී ස්ටාලින් බලයට පත්වීම.

❖ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් සියලුදෙනාම මොහු විසින් පක්ෂයෙන් තෙරපා හරිනු ලැබීම.

❖ සෝවියට් දේශය තුළ කර්මාන්ත දියුණුවක් ඇතිකිරීමට සාර්ථක පස් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කිරීම.

❖ කෘෂිකර්මාන්තය දියුණුකිරීම සඳහා සමූහ ගොවිපළවල් ඇරඹීම.

❖ සෝවියට් දේශය තුළ දැඩි ඒකාධිපති පාලනයක් ක්‍රියාත්මක කිරීම.

❖ දෙවන ලෝක යුධ සමයේදී මිත්‍ර ජාතීන් සමග එකතු වී, ෆැසිස්ට්වාදයට එරෙහිව සටන් කිරීම.

❖ කොමියුනිස්ට්වාදය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම හා ඊට සමාන්තරව නිරවි (තුෂ්ණී) යුද්ධය උත්සන්න වීම.

❖ 1953 දී මියයාම.

**(ලකුණු 08 යි)**

**(iv) තුෂ්ණී යුද්ධය**

❖ තුෂ්ණී (නිරවි) යුද්ධය යනු, විශේෂයෙන්ම දෙවන ලෝක යුද්ධයෙන් පසු අමරිකා එක්සත් ජනපදය ප්‍රධාන කොටගත් බටහිර (ධනවාදී) කඳවුර හා සෝවියට් දේශය ප්‍රධාන කොටගත් නැගෙනහිර යුරෝපා රටවල්වලින් යුත් (සමාජවාදී) කඳවුර අතර ඇති වූ දෘෂ්ටිවාදීමය, දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ගැටුමයි.

❖ මෙම ගැටුම හැඳින්වීමට Cold War හෙවත් තුෂ්ණී (නිරවි) යුද්ධය යන පදය මුලින් ම භාවිත කරන ලද්දේ ඇමරිකානු ව්‍යාපාරිකයෙකු හා ජනාධිපති උපදේශකයෙකු වූ බර්නාඩ් බාරුච් විසිනි.

❖ මෙහි ආරම්භය හා පැවති කාලය සම්බන්ධයෙන් විවිධ මත පැවතුණ ද බොහෝ විද්වත්හු මෙය 1945 සිට 1991 දක්වා පැවතුණේ යැයි සලකති.

❖ නිරවි යුද්ධයේ ප්‍රධාන ලක්ෂණ:

- අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව එකිනෙකාට විරුද්ධව විවෘත ලෙස යුද්ධ නොකිරීම.

- එලෙස විවෘත සටන් සිදුවූයේ පසම්තුරු කඳවුරු දෙකේ සහයෝගය ලත් අනුගාමී කණ්ඩායම් අතර පමණය.

  නිදර්ශන - කොමියුනිස්ට්වාදී උතුරු වියට්නාමය හා කොමියුනිස්ට් විරෝධී දකුණු වියට්නාමය අතර ගැටුම.
- කඳවුරු දෙක අතර පැවති අවිශ්වාසය මෙම ගැටුම වර්ධනය වීමට හේතු වීම.
- සෝවියට් රුසියාව, කොමියුනිස්ට්වාදය ලොව පුරා ව්‍යාප්ත කිරීමට උත්සාහගන්නා බවට චෝදනා කළ අමෙරිකාව එය වැළැක්වීමට උත්සාහ කිරීම.
- කොමියුනිස්ට්වාදය විනාශ කළ නොහැකි බව දුටු අමෙරිකාව එහි ව්‍යාප්තිය වළකාලීමේ ප්‍රතිපත්තියකට (containment policy) අවතීර්ණ වීම.

❖ වරින් වර කඳවුරු දෙකට අයත් රටවල් අතර ඇති වූ සටන් හැරුණු විට නිරවි යුද්ධය ක්‍රියාත්මක වූ අනෙකුත් ක්‍රම:

දේශපාලන හා ආර්ථික මතවාද පදනම් කරගත් සහ අන්‍යෝන්‍ය විවේචනය මුල් කොටගත් ප්‍රචාරණය, කඳවුරු තුළ දේශපාලන සම්බන්ධතා වර්ධනය කර ගැනීම, රහස් ඔත්තු සේවා මගින් සතුරු පක්ෂය පිළිබඳ තොරතුරු (විශේෂයෙන් යුද්ධෝපක්‍රම හා උපායයන් පිළිබඳ තොරතුරු) එක්රැස්කිරීම, තම කඳවුරට අයත් රටවලට ආර්ථික හා යුදමය ආධාර ලබාදීම (ට්‍රෲමන් න්‍යාය, මාර්ෂල් සැලැස්ම, කොමින්ෆෝර්ම්) අමෙරිකාව හා රුසියාව අතර අවි තරගය (පරමාණු, ජලකර, මිසයිල, ගුවන්යානා, චන්ද්‍රිකා තාක්ෂණය).

❖ ගොර්බචොෆ්ගේ පෙරෙස්ත්‍රොයිකා හා ග්ලාස්නොස්ට් ප්‍රතිපත්ති; සෝවියට් දේශය බිඳවැටීම හා තුෂ්ණී යුද්ධය අවසන් වීම.

**(ලකුණු 08 යි)**

★★★★★★★